12)

# පූර්ව පාසල් වයසේ දරුවන්ගේ භාෂා සංවර්ධනය.

අධ්‍යාපන දර්ශනපති උපාධිය.

1982.

අධ්‍යාපන පීඨය,

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ මණ්ඩපය,

කොළඹ 3.

379050

දයාවතී වෙල්ගම.

1981. 12. 28.

UCLIB
379050

379050

## සංක්ෂේපය

ලෝකයේ සංවර්ධිත රටවල මෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවලද අධ්‍යාපනය පිළිබඳව නව පිබිදීමක් පසුගිය දශකය තුළදී ඇතිවිය. " පූර්ව පාසල් අධ්‍යාපනය " ගැනද ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී රටවල කරන ලද පර්යේෂණවලින් නවතම තොරතුරු අප හමුවේ තිබේ. මේ දරුවන්ගේ අධ්‍යාපනයේ වැදගත් අංශයක් වන " භාෂා සංවර්ධනය " පිළිබඳව ශ්‍රී ලංකාවේ " සිංහල " දරුවන්ගේ නියැදියක් ඇසුරෙන් අධ්‍යයනයක් කිරීමට මා සිත් යොමුවිය.

පොතපතින් ලබාගත් දැනුම හා ගුරු වෘත්තියේදී මා ලද විවිධ අත්දැකීම්ද ඇසුරෙන් " වයස අවුරුදු 3, 4, හා 5 මට්ටම්වල දරුවන්ගේ භාෂා වර්ධනය " යන මාතෘකාව පිළිබඳව විස්තර ඉදිරිපත් කර ඇත. පොතපතින් ලබාගත් තොරතුරු ඇසුරෙන්.

: භාෂා සංවර්ධනය.

: පූර්ව පාසල් වයසේ ළමයි.

: අධ්‍යාපන පර්යේෂණවලින් භාෂා වර්ධනය පිළිබඳව ලබා ඇති ආභාෂය.

: පෙර පාසල් වයසේ ළමයින්ගේ භාෂා වර්ධනය.

: භාෂා වර්ධනයට බලපාන සාධක.

: පූර්ව පාසල් අධ්‍යාපනයේ අරමුණු හා භාෂා වර්ධනය.

යන කොටස් සකස් කරන ලදී.

මාතෘකාවට අදාළ පර්යේෂණය සඳහා හෝමාගම අධ්‍යාපන දිස්ත්‍රික්කයේ අර්ධ නාගරික ප්‍රදේශ කීපයකින් තෝරාගත්

අවුරුදු 3, 4, 5 වයස් මට්ටම්වල ළමුන් 60 කින් යුත් නියැදියක් යොදාගනිමි. ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡා මගින් දරුවන්ගේ සමාජ, ආර්ථික තොරතුරු ලබාගතිමි. ළමයින්ගේ " කථාව " තෙමසක් තුළදී වාර්තා කරගැනීම සඳහා නිවෙස්වල වැඩිහිටියන්ගේ සහාය ලබාගැනීමටත් පාසැලේදී විවිධ ක්‍රියාකාරකම් කරද්දී ළමයින්ගේ කතාබහ පටිගත කර ගැනීමටත් කටයුතු සැලසීමි.

<u>පර්යේෂණයෙන් ලබාගත් තොරතුරු.</u>

1. වාග්මාලාව.

   1. වාග්මාලාව වයස් මට්ටම් තුන අනුව ' අ ' කාරාදී පිළිවෙලට ඉදිරිපත් කිරීම.

   11. ළමුන් විසින් වචන භාවිතා කළ ප්‍රතිශතය අනුව වාග්මාලාව ඉදිරිපත් කිරීම.

   111. වාග්මාලාව පිළිබඳව වර්ගීකරණයක් කිරීම.

2. කථා ව්‍යවහාර ආශ්‍රයෙන්.

   1. ළමුන්ගේ ප්‍රකාශනවල ස්වභාවය අනුව ඒවා කොටස් 3 කට වර්ග කිරීම.

      1. ප්‍රශ්න, 2. විධාන, 3. වාක්‍ය.

   11. ළමුන්ගේ ප්‍රකාශනවල ඇති වාක්‍ය රටා ඉදිරිපත් කිරීම.

දත්ත විශ්ලේෂණය.

: වාග්මාලාව ළමයින්ගේ වයස අනුව සංඛ්‍යාත්මකව හා ගුණාත්මකව වර්ධනය වේ.

: ළමයාගේ සමාජ හා ආර්ථික පරිසරයේ බලපෑම ' භාෂාව ' තුළින් පෙනේ.

: භාෂා වර්ධනයට අත්දැකීම් වැදගත්වේ.

සමාජ හා ආර්ථික පරිසරය වාසිදායක වීම භාෂා වර්ධනයට රුකුලකි. එසේ නොමැතිවීම භාෂා වර්ධනය දුර්වල වේ.

: මේ වයසේ ළමයි තනිව කථාකරන අවස්ථා බොහෝය. ඒ අය වැඩිහිටියන් අනුකරණය කරමින්, විවිධ ක්‍රියාකාරකම්හි යෙදෙමින් 'ආත්ම කේන්ද්‍රීය කථාවේ' යෙදෙති. අවුරුදු තුනේදීට වඩා අවුරුදු (5) පසේදී මේ ලක්‍ෂණ අඩුවෙමින් යයි.

: අවට පරිසරය තේරුම් ගැනීමට ළමෝ නිතර ප්‍රශ්න නගති.

: සුහදව මෙන්ම චිත්තවේගිකව, පුද්ගලයින් අමතා විධාන කරන අවස්ථා පෙනේ.

: සරල වාක්‍ය හා බැඳි වාක්‍ය මේ අවධියේ ළමුන් භාවිතා කරති.

: වයස අනුව ඔවුන් නගන ප්‍රශ්න, දෙන විධාන හා ඉදිරිපත් කරන වාක්‍ය දිගින්ද වැඩිය.

: සිසුන්ගේ ප්‍රකාශනවල වාක්‍ය රටා ඇත.

: ළමුන්ගේ රුචිකම්, ලැදියාවන් භාෂාව තුළින් පෙනේ.

: මේ ළමෝ කථාවේදී අංගචලනද යොදාගනිති.

: සමහර ළමයි වැරදි ලෙස වචන උච්චාරණය කරති.

: සමහරු අවබෝධයකින් තොරව සංකල්ප නොමැති ව වචන භාවිතා කරති.

: ක්‍රීඩාව හා සමූහ ක්‍රියාකාරකම්හි යෙදීම භාෂා වර්ධනයට රුකුලකි.

: වයස අවුරුදු 5 වනවිට සියළුම ළමයින්ට අදහස් හුවමාරුවට, සිද්ධියක් විස්තර කිරීමට හැකියාව ලැබේ.

: මේ දරුවෝ පූර්ව පාසලෙන ලබන ඉගෙනීම මගින් භාෂා වර්ධනය සඳහා විවිධ අත්දැකීම් ලබති.

යෝජනා.

: භාෂා වර්ධනය සඳහා මේ වයසේ සියළුම ළමයින්ට වසරක්වත් පූර්ව පාසලේ අත්දැකීම් ලබා දිය යුතුය.

: පූර්ව පාසලේ භාෂා වර්ධනයට හිතකර පරිසරයක් තිබිය යුතුයි.

: පාසැලේදී ක්‍රමානුකූලව සැලසුම්කරගත් භාෂා වැඩ සටහනකට අනුව කටයුතු කිරීම අවශ්‍යයි.

: සවන්දීම හා කථාව දියුණු කිරීමත්, කියවීම හා ලිවීමට සූදානමත් පූර්ව පාසලකින් ලැබිය යුතුය.

: පර්යේෂණයෙන් ලැබුණු වාග්මාලාව ළමුන් සඳහා පොත් ලිවීමට, උපකාරීවනු ඇත.

: ළමයාගේ භාෂා දුර්වලතා හඳුනාගෙන ප්‍රතිකර්ම යෙදිය යුතුයි.

: නිවසේ වැඩිහිටියන්ද, ළමයින්ගේ භාෂා වර්ධනය ගැන සැලකිලිමත් විය යුතුයි.

පර්යේෂණයෙන් ලබාගත් නිදසුන් ආශ්‍රයෙන් නිගමන හා යෝජනා ඉදිරිපත් කර ඇත.